සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 9 - 2019

**නම : ..............................................** **නර්තනය** **කාලය : පැය 02 යි.**

වැදගත් :

I සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## I කොටස

I ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) උඩරට නර්තන සම්ප්‍රදායේ ගොඩ සරඹ මෙන් සබරගමු නර්තන සම්ප්‍රදායේ හඳුන්වනු ලබන්නේ,

(i) අත් සරඹ යනුවෙනි. (ii) ඉලංගම් සරඹ යනුවෙනි.

(iii) දොඹින පද යනුවෙනි. (iv) මාත්‍රා පද යනුවෙනි.

(2) අලංකාර පද නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ,

(i) උඩ පැනීම, කැරකීම වැනි ක්‍රියාකාරකම් උපයෝගී කර ගැනීම ය.

(ii) බෙර වාදනයට අනුව නර්තනයේ යෙදීම ය.

(iii) තාල රූපයේ පිළිබඳ අවධානය යොමු කිරීම.

(iv) ළමයින්ගේ උස් මිටි භේදය පිළිබඳව සොයා බැලීම.

(3) දේශීය තාල ප්‍රස්තාරකරණයේ දී යොදා ගනු ලබන තාල සංකේතයක් වන්නේ,

(i) ∩ ය. (ii) × ය.

(iii) + ය. (iv) o ය.

(4) මාත්‍රා හතරේ ( 4 + 4) තාල රූපයට නර්තනය කරනු ලබන වන්නමකි.

(i) සිංහරාජ වන්නම (ii) වෛරොඩි වන්නම

(iii) තුරඟා වන්නම (iv) හනුමා වන්නම

(5) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ පුද ලබන දෙවි කෙනෙකි.

(i) සමන් දෙවියන් (ii) කොහොඹා දෙවියන්

(iii) දැඩි මුණ්ඩ දෙවියන් (iv) පත්තිනි දෙවියන්

(6) ගැට බෙරයෙන් වාදනය වන සතර බීජාක්ෂර වනුයේ,

(i) තක, ජිත් තොං නං (ii) තත් ජිත් තොං නං

(iii) ජිත් තත් තොං නං (iv) තත් ජිත් තක ජිත් තොං නං

(7) ''කිත්තක දොම්කිට - කිටිතක දොම්කිට'' යනු,

(i) දවුල් සරඹයකි. (ii) පහතරට බෙර සරඹයකි.

(iii) උඩරට බෙර සරඹයකි. (iv) ගොඩ සරඹයකි.

(8) ''කොරවක් ගල'' ලෙන් ලිපිය අයත් යුගය වන්නේ,

(i) පොළොන්නරු යුගය (ii) ගම්පොළ යුගය

(iii) අනුරාධපුර යුගය (iv) කුරුණෑගල යුගය

(9) දෙවොල් මඩු සහ පහන් මඩු ශාන්ති කර්මවල පුරාවෘත්ත කතාවේ සඳහන් වන රජතුමා කවරෙක් ද?

(i) පඬුවස් දෙව් රජතුමා (ii) සේරමාන් රජතුමා

(iii) පරාක්‍රම බාහු රජතුමා (iv) විජය රජතුමා

(10)



ඉහත සඳහන් රූපයේ දක්නට ලැබෙන නර්තනාංගය වනුයේ,

(i) කථකලි නර්තනාංගයකි. (ii) භරත නර්තනාංගයකි.

(iii) මනිපුරි නර්තනාංගයකි. (iv) කථක් නර්තනයකි.

**I ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

**(භයානක, ස්වස්ථතාව, තිසර සන්දේශය, ආමද්, ලෝක ධර්මී)**

(11) 'නිලුපුල් දිගැසී තන රණ කලසී'..... යන කවිය........................................................... අයත් කවියකි.

(12) ලෝකයේ ස්වභාවයට අනුකූලව නාට්‍යයක සතර අභිනය භාවිත වන්නේ නම් එය ...................................... නාට්‍යය ලෙස හඳුන්වනු ලබයි.

(13) භය නැමති ස්ථායිභාවය මගින් .......................................... රසය නිරූපණය වේ.

(14) ........................................... යනු කථක් නර්තන අංගයකි.

(15) මානසික සාධක සහ කායික සාධක .............................................. කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙකකි.

I ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| පහළට පේළි | හරහට A තීරුව | B තීරුව | C තීරුව | D තීරුව |
|---|---|---|---|---|
| 1 | ගැටබෙරය | බුම්මැඩිය | බටනලාව | තාම්පුරාව |
| 2 | රබාන | පන්තේරුව | හක්ගෙඩිය | වීණාව |
| 3 | උඩැක්කිය | තම්මැට්ටම | හොරණෑව | තාලම්පට |
| 4 | දවුල | තබ්ලාව | කොම්බුව | පක්වාජ් |

(16) ඉහත වගුවේ පංචතූර්ය වාදනයට අයත් විතතාතත භාණ්ඩයක් ඇතුළත් වන්නේ,

(i) 2 පේළියේ B තීරුවේය. (ii) 4 පේළියේ A තීරුවේය.

(iii) 3 පේළියේ C තීරුවේය. (iv) 1 පේළියේ D තීරුවේය.

(17) සුසිර වර්ගයට අයත් වාද්‍ය භාණ්ඩ පමණක් දක්වෙනුයේ,

(i) 1, 2, 3, 4 පේළිවල B තීරුවේය. (ii) 1, 2, 3, 4 පේළිවල A තීරුවේය.

(iii) 1, 2, 3, 4 පේළිවල D තීරුවේය. (iv) 1, 2, 3, 4 පේළිවල C තීරුවේය.

(18) ඉහත වගුවෙහි සඳහන් උඩැක්කිය, දවුල, තම්මැට්ටම යන වාද්‍ය භාණ්ඩ පිළිවෙළින්,

(i) ආතත, විතතාත, විතත වේ. (ii) ආතත, විතත, විතතාතත වේ.

(iii) විතත, විතතාතත, ආතත වේ. (iv) විතත, ආතත, විතතාතත වේ.

(19) කථක් නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩ ඇතුළත් වන්නේ,

(i) 2 පේළියේ AB තීරුවල ය. (ii) 3 පේළියේ BD තීරුවල ය.

(iii) 4 පේළියේ BD තීරුවල ය. (iv) 1 පේළියේ AC තීරුවල ය.

(20) ඝන වාද්‍ය භාණ්ඩයක් ඇතුළත් වන්නේ,

(i) 1 පේළියේ A තීරුවේය. (ii) 3 පේළියේ D තීරුවේය.

(iii) 3 පේළියේ B තීරුවේය. (iv) 3 පේළියේ A තීරුවේය.

## II කොටස

I පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 02කට පමණක් පිළිතුරු සපයන්න.

(01) (i) ''අක්කේ අක්කේ අර බලන්නකෝ...........'' ගීතය පද රචනය කලේ කවුරුන් විසින් ද?

(ii) දහවන පා සරඹයේ සරඹ නාමය ලියන්න.

(iii) අර්නෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමා ප්‍රවීණ නර්තන ශිල්පියෙක් ලෙස ප්‍රගුණ කල නර්තන සම්ප්‍රදාය කුමක් ද?

(iv) ජීවිතයේ එදිනෙදා දක්නට ලැබෙන විවිධ අවස්ථා හා සිද්ධි සැබෑ ස්වරූපයෙන් බැහැර ව අතිශයෝක්තියෙන් වර්ණනා කෙරෙන නාට්‍යය විශේෂය කුමක් ද?

(v) කථක් නර්තන ප්‍රවර්ධනයට දායක වූ ශිල්පියෙක් නම් කරන්න. (ලකුණු 2 x 5 = 10)

(02) ''ගැමි සමාජය තුළ ශාන්තිකර්ම පිළිබඳව පවතින්නේ දෘඩ විශ්වාසයකි.''

(i) ශාන්ති කර්ම යනු කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(ii) දේශීය ශාන්ති කර්ම පැවැත්වීමේ අරමුණු තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ පුද ලබන දෙවි තුන් කට්ටුව සහ දෙවොල් මඩු ශාන්ති කර්මයේ පුද ලබන දෙවිවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 04)

(03) භාරතයේ ප්‍රචලිත නර්තන සම්ප්‍රදායන් ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) උත්තර භාරතයේ ප්‍රචලිත නර්තන සම්ප්‍රදාය නම් කර එම නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ දෙකක් ලියන්න. (ලකුණු 04)

(ii) ඉහත සඳහන් කල නර්තන සම්ප්‍රදායේ සංගීත සම්ප්‍රදාය කුමක් ද? (ලකුණු 02)

(iii) එම නර්තන සම්ප්‍රදාය හැදෑරීම සඳහා ආරම්භ කර ඇති අධ්‍යාපන ආයතන දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

(04) (i) දේශීය වාද්‍ය භාණ්ඩ වර්ගීකරණයට අනුව පංච තූර්ය භාණ්ඩ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 04)

(ii) පංචතූර්ය වාදනය පිළිබඳව සඳහන් වන වංශකතාව කුමක් ද? (ලකුණු 02)

(iii) එම වංශ කතාවේ පංචතූර්ය වාදනය පිළිබඳ සඳහන් කර ඇත්තේ කුමක් ද? (ලකුණු 04)

(05) ''රන්වන් දුල් කරලින් පැසිලා'' ..... යන ගීතයේ හෝ

(i) ''අක්කේ අක්කේ අර බලන්නකෝ''.............. යන ගීතයේ අර්ථය පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 04)

(ii) ඉහත සඳහන් ගීත දෙක සංගීත නිර්මාණය කළේ කවුරුන් විසින් ද? (ලකුණු 02)

(iii) ගීත අනුව නර්තන නිර්මාණය කිරීමේ දී සැලකිය යුතු කරුණු හතරක් ලියන්න. (ලකුණු 04)

(06) දේශීය නාට්‍යය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී නාට්‍යයන්හි සුවිශේෂ ලක්ෂණයක් දක්නට ලැබේ.

(i) මුද්‍රා නාට්‍යයක් යනු කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍යය නිෂ්පාදනය කල මුද්‍රා නාට්‍යය ශිල්පීන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රා නාට්‍ය කුමක් ද? (ලකුණු 02)

(07) (i) සිංහරාජ වන්නමේ බෙර පදය සහ එක් කවියක් මහ තනි තිතට ප්‍රස්ථාර කරන්න. (ලකුණු 05)

(ii) ගත්ත තෙහිගු තකට තකුද තක්කඩ ජික්කඩ තරිකිට තකට තකුද..... යන වෛරෝඩි වන්නමේ අඩව්වට අයත් පද දෙක අදාල තිතට ප්‍රස්තාර කරන්න. (ලකුණු 05)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

# තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 9 - 2019

## නර්තනය - පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | iii | 06. | ii | 11. | තිසර සංදේශයට | 16. | ii |
| 02. | iv | 07. | i | 12. | ලෝකධර්මී | 17. | iv |
| 03. | iii | 08. | iii | 13. | භයානක | 18. | i |
| 04. | i | 09. | ii | 14. | ආමාද් | 19. | iii |
| 05. | ii | 10. | iv | 15. | ස්වස්ථතාව | 20. | ii |

(1 x 20 = 20)

## II කොටස

01. (i) ආනන්ද සමරකෝන් මහතා
(ii) තුන්පැති අඩිය
(iii) උඩරට නර්තන සම්ප්‍රදාය
(iv) ශෛලිගත නාට්‍යය
(v) නවාබ් වජිඩ් අලීෂා, අච්චන් මහාරාජ්, බිර්ජු මහාරාජ් යන අයගෙන් කවරෙකු හෝ සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (2 x 5 ලකුණු 10)

02. (i) කිසියම් පුද්ගලයකුගේ මානසික හෝ කායික හෝ සුභ සිද්ධිය අරමුණුකොට දෙවියන්, යක්ෂයන් නැතහොත් වෙනත් බලවේග දුරුකර ශාන්තියක් උදෙසා පවත්වන කිසියම් කාර්ය සංසිද්ධියකි. (ලකුණු 03)
(ii) ། භවභෝග සම්පත් වැඩි දියුණු කර ගැනීම. (සශ්‍රීකත්වය උදෙසා)
། පුද්ගලයන්ට වැලදෙන යම් රෝගාබාධ සුවකර ගැනීම.
། ගමට, රටට සෙත් ශාන්තිය පැතීම.
། අධ්‍යාපනික අවශ්‍යතා (අධ්‍යයන හා පර්යේෂණ සඳහා) (ලකුණු 03)
(iii) කොහොඹා කංකාරියේ පුද ලබන දෙවි තුන් කට්ටුව
། අලුත් කොහොඹා දෙවි
། මහ කොහොඹා දෙවි
། පරණ කොහොඹා දෙවි
දොවොල් මඩුවේ : පත්තිනි දෙවි, දොවොල්, දැඩි මුණ්ඩ, දොළහ දෙවියෝ (ලකුණු 04)

(03) (i) ། කථක් නර්තන සම්ප්‍රදාය (ලකුණු 02)
། ප්‍රචලිත ප්‍රදේශ : මහාරාෂ්ඨය, ගුජරාට්, රාජස්ථාන්, දිල්ලි ලක්නව් (ලකුණු 02)
(ii) උත්තර භාරතීය හින්දුස්ථානි සංගීත සම්ප්‍රදාය (ලකුණු 02)
(iii) දිල්ලි කථක් කේන්ද්‍රය, භාත්ඛණ්ඩේ විශ්ව විද්‍යාලය (ලකුණු 04)

(04) (i) ། වාදනය කරන ආකාරය අනුව කොටස් පහකට බෙදා තිබෙන බව
། කොටස් පහ නම්කර තිබීම. (ආතත, විතත............... යනුවෙන්)
། කොටස් පහ පිළිබඳව කෙටියෙන් විස්තර කර, උදා : ලෙස වාද්‍ය භාණ්ඩ සඳහන් කර තිබීම.
། වාදනය කරන අවස්ථා (ලකුණු 04)

(ii) මහා වංශය (ලකුණු 02)

(iii) අශෝක අධිරාජයා ලක්දිවට එවන ලද බෝධි ශාඛාවට රජුගේ නියමය පරිදි බෝධි ශාඛාවට පැවැත්විය යුතු ප්‍රජා අතුරින් ඉතා උත්කෘෂ්ඨ ශබ්ද ප්‍රජාවක් වූ පංචාංගික තූර්ය නාදය එලෙසින් ම පැවැත්විය යුතු බව මහා වංශයේ සඳහන් වේ. (ලකුණු 04)

(05) (i) කෘෂිකාර්මික ජන ජීවන රටාවක් ගත කරන ගැමි පරිසරයක ජීවත්වන ගොවියන් ගෙවිලියන් තම කෘෂිකාර්මික ජීවිතයේ සිදු කරනු ලබන යම් යම් සිද්ධි කිහිපයක් ද සශ්‍රීකත්වය හා ඔවුන්ගේ ගැමි සංස්කෘතිය පිළිබඳව ද රන්වන් දුන්.............. ගීතයෙන් අර්ථ ගැන්වේ.

එදිනෙදා ජීවිතයේ අත් දකින අවස්ථාවක් අක්කේ අක්කේ..... ගීතයෙන් කියවේ. සුවිශේෂ අවස්ථාවක් වන මෙය විටෙක ප්‍රීතියෙන් පිනා යද්දී තවත් විටෙක භයංකර සිතුවිලි මැවේ. බියකරු අවස්ථාව හුවා දක්වමින් රචනා කරන ලද භාව පූර්ණ ගීතයකි. (ලකුණු 02)

(ii)
- රන්වන් දුන් ................. සංගීතය - ආර්. මුත්තුසාමි මහතා
- අක්කේ අක්කේ ........... සංගීතය - ආනන්ද සමරකෝන් මහතා (ලකුණු 02)

(iii)
- ගීතය ශ්‍රවණය කර අර්ථය වටහා ගැනීම.
- තාලය, රිද්මය, ලය ප්‍රකාශනය පිළිබඳ අවබෝධ කර ගැනීම.
- සුදුසු චලන ගොඩ නැගීම.
- චලන යොදා ගනිමින් නර්තන අංගයක් ගොඩ නැගීම.
- තල, දිසා, රටා, අවකාශ නිසි ලෙස යොදා ගනිමින් නර්තන අංගයක් නිර්මාණය කිරීම.

(ලකුණු 04)

(06) (i) වාචික අභිනයෙන් තොරව චලන මාධ්‍යයෙන් කිසියම් තේමාවක් පදනම් කොටගෙන නිර්මාණය කරන ලද, මුද්‍රා මගින් අදහස් ප්‍රකාශ කරන නාට්‍ය මුද්‍රා නාට්‍ය නමින් හඳුන්වයි. (ලකුණු 04)

(ii) චිත්‍රසේන මහතා
වජිරා මහත්මිය
ප්‍රේමකුමාර පිටවෙල මහතා
එස් පණීභාරත මහතා
ඉඹුල්ගොඩ මහතා (ලකුණු 04)

(iii) ''සීතාහරණ'' මුද්‍රා නාට්‍ය (ලකුණු 02)

(07) (i)

| | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 | 1´ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | දො | දොං | - | ත | ත | කු | දොං | - | දො | දොං | - | ත | ත | කු | දොං | - |
| කවිය | + | පෙ | රත් | ක | ලෙ | ක | සි | හ | - | ර | ජෙක් | වැ | ටු | ණි | ම | හ |
| | + | ළි | දක් | තු | ළ | ක | ඉ | බි | - | ල | ඬෙක් | ක | ර | පු | වැ | ඩ |
| | + | හැ | රත් | මෙ | හෙ | ම | ය | ස | - | වැ | ඩක් | උ | නේ | - | නැ | ත |
| | + | චි | රත් | ක | ලෙ | ක | පැ | ව | - | තු | මත් | ය | සයි | - | හැ | ඩ |

නිවැරදි තාල සංකේත භාවිතයට (ලකුණු 02)
කවිය ප්‍රස්තාරයට (ලකුණු 03)

| 1´ | 2 | 3 | 1´ | 2 | 3 | 1´ | 2 | 3 | 1´ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගත් | - | ත | තෙ | හි | ගු | ත | ක | ට | ත | කු | ද |
| තක් | කඩ | ජිත් | කඩ | තරි | කිට | ත | ක | ට | ත | කු | ද |

නිවැරදි තාල සංකේත භාවිතයට (ලකුණු 02)
අඩව්වේ පද ප්‍රස්තාරයට (ලකුණු 03)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019
# Third Term Test - Grade 9 - 2019

## නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය

01. (i) කැමති ගායනයක් (ලකුණු 05)

 (ii) ගුරුවරයා විසින් නම් කරන ලද ගායනයක් (ලකුණු 05)

02. (i) 10, 11, 12 පා සරඹ වලින් ගුරුවරයා නම් කරන ලද පා සරඹයක් නර්තනය හා හමාර පදය නර්තනය (ලකුණු 05)

 (ii) 9 වෙනි ගොඩ සරඹය නර්තනය, කස්තිරම නර්තනය (ලකුණු 05)

03. සිංහරාජ වන්නම නර්තනය (ලකුණු 10)

04. (i) පන්නෙලීම හෝ ගොයම් ගැමි නැටුම්වලින් එකක් නර්තනය කිරීම. (ලකුණු 05)

 (ii) ගීත අනුව නර්තනයක් ඉදිරිපත් කරවීම. (ලකුණු 05)

 - අක්කේ අක්කේ ...................................
 - රන්වන් දුල් කරලින් ................................... (ලකුණු 05)

05. ධීවරයා, කුඹල්කරු, ගොවියා, තේ දළු නෙලන්නිය යන මිනිස් චරිත නිරූපණයක් ඉදිරිපත් කිරීම. (ගුරුවරයාට අභිමත පරිදි) (ලකුණු 05)